# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2025 දෙසැම්බර් 31 |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2025 නොවැම්බර්

### ජංගම ගිණුමේ ශේෂය*




* සංශෝධිත

### මුළු අපනයන
(භාණ්ඩ හා සේවා)

එ.ජ.ඩො. මිලියන **1,609**
2025 නොවැම්බර් මාසයේ දී
2.3% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)



එ.ජ.ඩො. බිලියන **18.8**
2025 ජන.-නොවැ. මාස තුළ දී
4.9% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

### භාණ්ඩ අපනයන

එ.ජ.ඩො. මිලියන **1,048**
2025 නොවැම්බර් මාසයේ දී
5.4% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)



### භාණ්ඩ අපනයන

එ.ජ.ඩො. බිලියන **12.4**
2025 ජන.-නොවැ. මාස තුළ දී
6.4% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

### සේවා අපනයන

එ.ජ.ඩො. මිලියන **561**
2025 නොවැම්බර් මාසයේ දී
3.0% (වාර්ෂික ලක්ෂ්‍යමය අඩු වීම)



### සේවා අපනයන

එ.ජ.ඩො. බිලියන **6.3**
2025 ජන.-නොවැ. මාස තුළ දී
2.2% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

සහාය විය. සහාය විය.

### සංචාරක ඉපැයීම්

එ.ජ.ඩො. මිලියන **252 ****
2025 නොවැම්බර් මාසයේ දී

එ.ජ.ඩො. මිලියන **273**
2024 නොවැම්බර් මාසයේ දී




** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලැබූ නව සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව

### භාණ්ඩ ආනයන

එ.ජ.ඩො. මිලියන **1,778**
2025 නොවැම්බර් මාසයේ දී
18.9% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

එ.ජ.ඩො. බිලියන **19.3**
2025 ජන.-නොවැ. මාස තුළ දී
14.2% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

### වෙළඳ හිඟය

**2025 නොවැ.: එ.ජ.ඩො. මිලියන 731**
2024 නොවැ.: එ.ජ.ඩො. මිලියන 502

**2025 ජන.-නොවැ.: එ.ජ.ඩො. බිලියන 6.9**
2024 ජන.-නොවැ.: එ.ජ.ඩො. බිලියන 5.2

### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ



එ.ජ.ඩො. මිලියන **673**
2025 නොවැම්බර් මාසයේ දී
27.0% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

එ.ජ.ඩො. මිලියන **530**
2024 නොවැම්බර් මාසයේ දී

### දළ නිල සංචිත***

එ.ජ.ඩො. බිලියන **6.0**
2025 නොවැම්බර් අවසානයට



ආනයනික ආවරණය මාස **3.4**

*** චීන මහජන බැංකුව සමඟ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළුව

### විනිමය අනුපාතිකය
(එ.ජ. ඩොලරයට රුපියල්)




2025 වසර ආරම්භයේ සිට දෙසැම්බර් මස අවසානය දක්වා කාලය තුළ දී
අවප්‍රමාණය **5.6%**

**විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය**

**2025 නොවැම්බර්**

- 2025 වසරේ සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස දෙක තුළ දී අඛණ්ඩ මාසික ජංගම ගිණුමේ හිඟයන් වාර්තා කිරීමෙන් අනතුරුව 2025 වසරේ නොවැම්බර් මාසයේ දී, ජංගම ගිණුම නැවත අතිරික්තයක් වාර්තා කළේය. 2025 වසරේ ජනවාරි-නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ දී ජංගම ගිණුමේ අතිරික්තය එ.ජ. ඩොලර් මිලියන 1,678කි.
- 2025 වසරේ නොවැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පසුගිය වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. තවද, 2025 වසරේ ජනවාරි-නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 6.9ක් දක්වා පුළුල් විය.
- පෞද්ගලික රථවාහන සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ඇතුළුව වාහන ආනයනය සඳහා වූ වියදම 2025 වසරේ නොවැම්බර් මාසය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 281කි. 2025 වසරේ නොවැම්බර් මසින් අවසන් වන මාස එකොළහ සඳහා රථ වාහන ආනයන මුළු වියදම එ.ජ. ඩොලර් මිලියන 1,746ක් විය.
- අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයන මිල ගණන්වල ඉහළ වැඩිවීමක් පිළිබිඹු කරමින්, 2025 වසරේ නොවැම්බර් මාසයේ දී වෙළඳ මිල අනුපාතය වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත පහළ ගිය අතර, 2025 වසරේ ජනවාරි - නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ මිල අනුපාතය 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය.
- 2025 වසරේ නොවැම්බර් මාසයේ දී, සේවා ගිණුමේ අතිරික්තය පෙර මාසයට සාපේක්ෂව ඉහළ යෑමක් වාර්තා කළ ද වාර්ෂික ලක්ෂ්‍යාමය පදනමින් සැසඳීමේ දී අඩු වූ අතර ඒ සඳහා සංචාරක ඉපැයීම්, මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා සහ අනෙකුත් ප්‍රධාන සේවා ලැබීම් අඩුවීම හේතු විය. කෙසේ වෙතත්, 2025 වසරේ ජනවාරි-නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ දී සේවා ගිණුමේ අතිරික්තය වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත වර්ධනයක් වාර්තා කළ අතර එය ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3.4ක් විය.
- 2025 වසරේ නොවැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් මාසික ලක්ෂ්‍යාමය සහ වාර්ෂික ලක්ෂ්‍යාමය යන දෙආකාරයෙන්ම ඉහළ යෑමක් වාර්තා කළේය. සංචාරක ඉපැයීම් 2025 වසරේ නොවැම්බර් මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළ ද එය 2024 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව සුළු අඩු වීමක් වාර්තා කළේය.
- අඛණ්ඩ ධනාත්මක වර්ධන ප්‍රවණතාවයක් පිළිබිඹු කරමින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2025 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 673ක් වූ අතර, එය පෙර වසරේ එම මාසයට වඩා ඉහළ යෑමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2025 වසරේ නොවැම්බර් මසින් අවසන් වන මාස එකොළහ තුළ දී ප්‍රේෂණ වාර්ෂිකව සියයට 20.1ක වර්ධනයක් වාර්තා කළ අතර එය ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 7.2ක් විය.
- රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2025 වසරේ නොවැම්බර් මාසය තුළ දී ශුද්ධ ලැබීමක් වාර්තා කරන ලද අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන මාසය තුළ දී ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- අඛණ්ඩ විදේශීය ණය සේවා සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුවද, 2025 වසරේ නොවැම්බර් මාසය අවසන් වන විට, චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව, දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.0ක පමණ මට්ටමක පැවතුණි.
- 2025 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 5.6කින් අවප්‍රමාණය විය.

සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන මාසික විදේශීය අංශ විවරණිකාවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ විදේශීය අංශ සංඛ්‍යාලේඛන වෙබ් පිටුවලින් ලබා ගත හැකි අතර, ඒවාට පහත වෙබ් සබැඳි හරහා ප්‍රවේශ විය හැකිය:

https://www.cbsl.gov.lk/en/external-sector-bulletin
https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/external-sector

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)

| කාණ්ඩය | 2024 නොවැම්බර් (එ.ජ.ඩොලර් මිලියන) | 2025 නොවැම්බර් (එ.ජ.ඩොලර් මිලියන) | වෙනස (%) | 2024 ජන. - නොවැ. (එ.ජ.ඩොලර් මිලියන) | 2025 ජන. - නොවැ. (එ.ජ.ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **ජංගම ගිණුමේ ශේෂය[1]** | 166.7 | 81.7 | -51.0 | 1,714.8 | 1,677.7 | -2.2 |
| **වෙළඳ ශේෂය** | -502.2 | -730.7 | | -5,246.7 | -6,912.0 | |
| වෙළඳ භාණ්ඩ අපනයන | 994.1 | 1,047.8 | 5.4 | 11,670.2 | 12,412.8 | 6.4 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,496.3 | 1,778.5 | 18.9 | 16,916.9 | 19,324.7 | 14.2 |
| **සේවා ගිණුම (ශුද්ධ)** | 293.2 | 270.4 | -7.8 | 3,307.7 | 3,363.4 | 1.7 |
| සේවා ගිණුම - ලැබීම් | 578.5 | 560.9 | -3.0 | 6,208.6 | 6,345.0 | 2.2 |
| *එයින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් (ආ) | 272.9 | 251.6 | -7.8 | 2,806.5 | 2,910.6 | 3.7 |
| මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා | 155.0 | 125.7 | -18.9 | 1,636.5 | 1,694.4 | 3.5 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවා | 74.9 | 58.1 | -22.4 | 773.0 | 729.7 | -5.6 |
| සේවා ගිණුම - ගෙවීම් | 285.3 | 290.5 | 1.8 | 2,900.9 | 2,981.7 | 2.8 |
| *එයින්,* | | | | | | |
| විදේශ සංචාර | 68.9 | 97.8 | 41.8 | 674.7 | 723.7 | 7.3 |
| මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා | 109.1 | 70.6 | -35.3 | 900.6 | 913.3 | 1.4 |
| **ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)** | -145.8 | -123.1 | | -2,180.7 | -1,852.0 | |
| ප්‍රාථමික ආදායම් ගිණුම - ලැබීම් | 51.9 | 57.7 | 11.1 | 536.8 | 554.4 | 3.3 |
| ප්‍රාථමික ආදායම් ගිණුම - ගෙවීම් | 197.7 | 180.8 | -8.6 | 2,717.5 | 2,406.4 | -11.4 |
| *එයින්,* | | | | | | |
| සෘජු ආයෝජන ආශ්‍රිත | 80.2 | 38.1 | -52.5 | 778.4 | 953.5 | 22.5 |
| විවිධ ආයෝජන ආශ්‍රිත | 8.1 | 50.4 | | 693.0 | 439.4 | -36.6 |
| අනෙකුත් ආයෝජන: පොලී | 107.9 | 90.7 | -15.9 | 1,227.6 | 989.1 | -19.4 |
| **ද්විතීයික ආදායම් ගිණුම (ශුද්ධ)** | 521.4 | 665.1 | 27.5 | 5,834.6 | 7,078.2 | 21.3 |
| *එයින්,* | | | | | | |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් | 530.1 | 673.4 | 27.0 | 5,961.6 | 7,197.1 | 20.7 |
| පෞද්ගලික සංක්‍රාම ගෙවීම් | 9.4 | 9.1 | -3.1 | 136.8 | 121.4 | -11.3 |
| **මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම්** | | | | | | |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් (ඇ) | -10.6 | -12.0 | | 34.5 | -115.3 | |
| රාජ්‍ය සුරකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් | 20.3 | 4.3 | -79.0 | -197.3 | 252.5 | |
| සංචිතවල සිදු වූ වෙනස්වීම් (ඈ) | -21.1 | -182.5 | | 2,058.9 | -88.0 | |

**මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ**

(අ) තාවකාලික
(ආ) සංචාරක පැමිණීම්, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකු විසින් දිනක් සඳහා දරන සාමාන්‍ය වියදම් මත පදනම්ව සංචාරක ඉපැයීම් ගණනය කෙරේ. සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය මාසිකව වෙනස් වන අතර, සංචාරක ආගමන දත්ත මත පදනම් වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද නව සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංචාරකයෙකු විසින් එක් දිනක් තුළ දරන වියදමෙහි සාමාන්‍යය 2025 අගෝස්තු මාසයේ සිට සංශෝධනය කරන ලදී
(ඇ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව
(ඈ) සංචිත වත්කම් තත්ත්වයට බලපාන තක්සේරු වෙනස්වීම් ඇතුළත් වේ

[1] 2025 වසරේ තෙවන කාර්තුව සඳහා ඇස්තමේන්තු සම්පාදනය අවසන් කිරීමෙන් පසුව, 2025 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය සඳහා මාසික ජංගම ගිණුම් දත්ත සංශෝධනය කර ඇත. අදාළ කාර්තුමය ඇස්තමේන්තු සම්පාදනය අවසන් කිරීමෙන් පසු, සිව්වන කාර්තුව සඳහා දත්ත 2025 වසර අවසානය වන විට සංශෝධනය කෙරේ.